විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
ஓய்வூதியத் திணைக்களம்
DEPARTMENT OF PENSIONS

මහලේකම් කාර්යාලය, මාලිගාවත්ත, කොළඹ 10. மாளிகாவத்தை செயலகம், மாளிகாவத்தை, கொழும்பு 10. Maligawatte Secretariat, Maligawatte, Colombo 10.


අංකය / இல. / No. විවැ/චක්‍රලේඛ/2013

දිනය / திகதி / Date 2013-09-20

**විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 03/2013**

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් ,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ දිසා ලේකම්වරුන්/
ප්‍රාදේශීය ලේකම්වරුන්,

**<u>විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 13/ 2010 යටතේ වැන්දඹු වැටුපෙන් 50% ක් ගෙවීම සම්බන්ධව වැටුප ගණනය කිරීම</u>**

2010-12-16 දිනැතිව නිකුත් කරන ලද විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 13/ 2010 කෙරේ ඔබගේ අවධානය යොමු කරවමි.

02. එකී චක්‍රලේඛයේ විධිවිධාන යටතේ යලි විවාහ වන වැන්දඹුවන්ට හා වැන්දඹු පුරුෂයන්ට වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුපෙන් 50% ක් (හරි අඩක්) ගෙවීම යන ශීර්ෂ යටතේ මේ වන විට වැටුප් ගෙවමින් පවතී. නමුත් මෙහිදී ත්‍රිවිධ හමුදා මඟින් අදාළ දායකයා මියගිය දිනට හිමි ඔහු ලද වැටුපෙන් 50% ක් වැන්දඹු විශ්‍රාම වැටුප් ලෙස ගෙවීම් කිරීමට අයදුම්පත් වල සඳහන් කර එවනු ලබන බව නිරන්තරයෙන් නිරීක්ෂණය වන බැවින් විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 13/ 2010 අනුව නැවත විවාහ වන වැන්දඹුවන්ට හා වැන්දඹු පුරුෂයන්ට වැන්දඹු/ වැන්දඹු පුරුෂ විශ්‍රාම වැටුපෙන් හරි අඩක් ගෙවීම (50% ගෙවීම) සඳහා වන ගණනය කිරීමේ ක්‍රමවේදය නිවැරදි කළ යුතු බව පෙනී ගොස් ඇත.

03. එසේම දැනට ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් වැන්දඹු/ වැන්දඹු පුරුෂ විශ්‍රාම වැටුපෙන් 50% ගෙවීම් කිරීමේදී විවිධ ක්‍රම අනුගමනය කරන බව හඳුනාගෙන ඇති බැවින් නිවැරදි ක්‍රමවේදය අනුව විශ්‍රාම වැටුප් ගණනය කිරීමේ අවශ්‍යතාව මතු වී ඇත. ඒ අනුව විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 13/ 2010 අනුව වැන්දඹු/ වැන්දඹු පුරුෂ විශ්‍රාම වැටුප ගණනය කිරීම සඳහා පහත සඳහන් උපදෙස් පිළිපදින ලෙස දන්වා සිටිමි.

දායකයා මියගිය දින සිට වැන්දඹුව/ වැන්දඹු පුරුෂයා නැවත විවාහ වූ දිනය දක්වා වැන්දඹු/ වැන්දඹු පුරුෂ විශ්‍රාම වැටුප පරිවර්තනය කර එම සම්පූර්ණ විශ්‍රාම වැටුපෙන් අඩක් (50%) වැන්දඹු/ වැන්දඹු පුරුෂ විශ්‍රාම වැටුප් වශයෙන් ගණනය කල යුතුය.


| | Telephone | Fax | | Telephone | Fax | | Telephone | |
|---|---|---|---|---|---|---|---|---|
| Director General | 2431647 | 2342078 | W&OP | 2332346 | 2432214 | Policy | 2329580 | |
| Director | 2432008 | 2342078 | PSPF | 2324375 | 2332347 | Forces | 2320439 | |
| Director (F) | 2434974 | 2391403 | L.G.U. | 2342525 | 2342525 | Computation | 2434414 | E-mail: pensions@sltnet.lk |

පහත උදාහරණය මඟින් එම ගණනය කිරීම සිදුකරන ආකාරය දක්වා ඇත.

උදාහරණය: 1980- 01- 01 දින විශ්‍රාම ගොස් 1989- 01- 16 දින මියගිය අයකුගේ 2007- 01- 01 දින නැවත විවාහ වූ වැන්දඹුවට වැන්දඹු විශ්‍රාම වැටුපෙන් 50% ගෙවීම සඳහා පරිවර්තනය කරන අයුරු.

| | | |
|---|---|---|
| 1980- 01- 01 දිනට අඩු නොකල වාර්ෂික වැන්දඹු විශ්‍රාම වැටුප | | රු. 4440.00 |
| මාසික අතිරේක ප්‍රතිලාභ | | රු. 107.00 |
| 1980-01-01 දිනට අඩු නොකල මාසික වැන්දඹු විශ්‍රාම වැටුප | | රු. 4440.00 : 12 |
| | | රු 370+107 |
| 1980-01-01 දිනට මාසික වැන්දඹු විශ්‍රාම වැටුප | | රු. 477.00 |
| 1987-01-01 දිනට මාසික වැන්දඹු විශ්‍රාම වැටුප | | රු 744.00 |
| 1988-01-01 දිනට මාසික වැන්දඹු විශ්‍රාම වැටුප | | රු. 1448.00 |
| 1989-01-16 දිනට මාසික වැන්දඹු විශ්‍රාම වැටුප | | රු. 1448.00 |
| | 16/94 | රු. 652.00 45% |
| 1994-05-01 දිනට මාසික වැන්දඹු විශ්‍රාම වැටුප | | රු. 2100.00 |
| | 05/99 | රු. 860.00 |
| | | රු. 2960.00 |
| | (01/97) | රු. 148.00 |
| 1997-01-01 දිනට මාසික වැන්දඹු විශ්‍රාම වැටුප | | රු. 3108.00 |
| | (01/98) | රු. 148.00 |
| 1998-01-01 දිනට මාසික වැන්දඹු විශ්‍රාම වැටුප | | රු. 3256.00 |
| | (01/2000) | රු. 400.00 |
| 2000-01-01 දිනට මාසික වැන්දඹු විශ්‍රාම වැටුප | | රු. 3656.00 |
| | (17/2003) | රු. 365.60 |
| 2004-01-01 දිනට මාසික වැන්දඹු විශ්‍රාම වැටුප | | රු. 4021.60 |
| | (14/2004) | රු. 750.00 |
| 2004-12-01 දිනට මාසික වැන්දඹු විශ්‍රාම වැටුප | | රු 4771.60 |
| | (09/2000) | රු 500.00 |
| | (7/2001) | රු. 750.00 |
| | | රු. 6021.60 |
| | (12/2005) | රු. 602.16 |
| 2006-01-01 දිනට මාසික වැන්දඹු විශ්‍රාම වැටුප | | රු. 6623.76 |
| | | රු. 6623.76 x 50/100 |
| වැන්දඹුවට ලැබෙන 50% විශ්‍රාම වැටුප | | රු. 3311.88 ක් වේ. |

04. වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුපෙන් 50% ගෙවීමේදී ජීවන වියදම් දීමනාව අඩක් ලබාදිය යුතු අතර, අයවැය යෝජනා මඟින් ලබා දී ඇති විශේෂ දීමනා සම්බන්ධයෙන් මවිසින් නිකුත් කරන ලද 2011-12-20 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 11/ 2011 හි සඳහන් විධිවිධාන අනුව ක්‍රියාකළ යුතුය.

05. වැන්දඹුව නැවත විවාහ වන දිනය 2010-08-17 දිනට පෙර දිනයක් නම් 2010-08-17 දින සිට වැන්දඹු වැටුපෙන් 50% ගෙවීම් ඇරඹිය යුතු අතර, වැන්දඹුව නැවත විවාහ වූ දිනය 2010-08-17 දිනට පසු දිනයකදී නම් එකී ගෙවීම විවාහ වූ දිනයේ සිට ආරම්භ කළ යුතුය.

06. මියගිය දායකයාට/ දායිකාවට දාව උපන් අනත්දරුවන් සිටින්නේ නම් එම අනත්දරුවන් වෙත අනත්දරු විශ්‍රාම වැටුප් හිමිගැන්විය යුතුය. අනත්දරුවන්ගේ හිමිකම අවසන් වූ පසු වැන්දඹුව වෙත වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුපෙන් 50% ක් ලබාදීම ආරම්භ කළ යුතුය. විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 13/ 2010 අනුව අවුරුදු 26 ට අඩු විවාහක අනත්දරුවන්ට හිමිකම ලබා දී ඇති බැවින් අනත්දරු ගෙවීම් කිරීමේදී මෙම කරුණු සැලකිල්ලට ගත යුතු බවද අවධාරණය කරමි.

07. නැවත විවාහ වන වැන්දඹුවට/ වැන්දඹු පුරුෂයාට වැන්දඹු වැටුපෙන් 50% ගෙවීම් කිරීමේදී දායකයාට දාව උපන් ආබාධිත දරුවකු සිටින්නේ නම් ආබාධිත දරුවාගේ හිමිකම අහිමි නොකළ යුතුය.

08. වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුපෙන් 50% ගෙවීම් කිරීමේදී පහත සඳහන් කරුණු කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

I. මේ වන විට 1997- 01- 01 දිනට ප්‍රථම විශ්‍රාම ගිය අයවලුන් සඳහා විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 6/ 2004 හා 2/ 2006 විෂමතා ඉවත් කර ඇති අතර, එවැනි වැන්දඹුවන් සඳහා 50% වැටුප් ගෙවීමේදී එම සංශෝධිත වැටුපින් 50% ක් ගෙවීම් කළ යුතුය.

II. වැන්දඹුව හෝ වැන්දඹු පුරුෂයා වර්තමානයේදී රජයේ රැකියාවක නිරත වන්නේ ද යන්න ග්‍රාම නිලධාරී මඟින් සනාථ කර ගත යුතුය. එසේ වී නම් වැන්දඹු විශ්‍රාම වැටුප සමඟ ජීවන වියදම් දීමනාව ගෙවීම අත්හිටවිය යුතුය. මේ වන විට ගෙවා තිබේ නම් එකී මුදල් ආපසු අයකරගත යුතුය.

III. නැවත විවාහ වූ වැන්දඹුවගේ/ වැන්දඹු පුරුෂයාගේ ඉල්ලීම සමඟ සම්පූර්ණ ලිපිගොනුවම අදාල නිර්දේශ හා ලිපි ලේඛණ සමඟ මෙම දෙපාර්තමේන්තුවට යොමු කළ යුතුය. එම ගොනු සඳහා ප්‍රදානය නිකුත් කිරීම මවිසින් සිදු කරනු ඇත. වැන්දඹු විශ්‍රාම වැටුපෙන් 50% ගෙවීමට අදාලව සංශෝධිත වැන්දඹු/ වැන්දඹු පුරුෂ ප්‍රදාන පත්‍රයක් නිකුත් කිරීම අනිවාර්යය වන අතර, ප්‍රදාන පත්‍රයේ වැන්දඹු විශ්‍රාම වැටුප් අංකය වෙනස් නොවිය යුතුය.

09. ඉහත සඳහන් උපදෙස් අනුව ඉදිරි කටයුතු කිරීම සඳහා වැන්දඹු/ වැන්දඹු පුරුෂ විශ්‍රාම වැටුපෙන් 50% ගෙවීම් කරනු ලබන සියළුම ගොනු ගෙවීම නතර කිරීමකින් තොරව "විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අංශය" වෙත යොමු කිරීමට කටයුතු කරන්න. වැඩිදුර තොරතුරු අවශ්‍ය වන්නේ නම් පහත සඳහන් දුරකථන අංක ඇමතීමට හැකි බව වැඩිදුරටත් දන්වා සිටිමි.

011-2209803 } විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ,
011-2336913 } වැන්දඹු අනත්දරු අංශය

එස්. එස්. හෙට්ටිආරච්චි
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

පිටපත් - 01. ජනාධිපති ලේකම්
02. ලේකම් - රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
03. විගණකාධිපති
04. ලේකම් - මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය
05. අමාත්‍ය මණ්ඩල ලේකම්
06. ලේකම් - රාජ්‍ය ආරක්ෂ, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය